# පළාත් පාලන ආයතන වල ආදායම් ප්‍රභවයන්

එච්. ජී. සී. ජයතිස්ස

*උපදේශක (නීති හා පළාත් පාලන)*

ආසියා පදනමේ උප ජාතික පාලන
වැඩසටහන මගින් ප්‍රකාශයට පත් කරන ලදී

Australian AID

The Asia Foundation

# පළාත් පාලන ආයතන වල ආදායම් ප්‍රභවයන්


එච්. ජී. සී. ජයතිස්ස

*උපදේශක (නීති හා පළාත් පාලන)*



ආසියා පදනමේ උප ජාතික පාලන
වැඩසටහන මගින් ප්‍රකාශයට පත් කරන ලදී

Australian AID

The Asia Foundation

ආසියා පදනමේ උප ජාතික පාලන වැඩසටහන
මඟින් ප්‍රකාශයට පත් කරන ලදී

පළමු සංස්කරණය,

© සියලුම හිමිකම් 2017 ආසියා පදනම සතුවේ.

ISBN 978-955-0168-24-8

සංස්කාරක
එච්. ජී. සී. ජයතිස්ස මහතා විසිනි

මුද්‍රණය කරන ලද්දේ

කොළඹ, ශ්‍රී ලංකාව

# ආසියා පදනම

ආසියා පදනම යනු ලාභ නොලබන ජාත්‍යන්තර සංවර්ධන සංවිධානයකි. නිරන්තර වෙනස්වීම් වලට භාජනය වන හා සංවර්ධනය වෙමින් පවතින ආසියාවේ ජීවිත ශක්තිමත් කිරීම වෙනුවෙන් ආසියා පදනම කැපවී සිටී. දශක හයක් තුළ ලත් අත්දැකීම් හා පන්නරය හරහා හඳුනාගෙන වැඩිදියුණු කළ අරමුණු 5ක් යටතේ අප ආසියා කලාපයේ සංවර්ධන කටයුතු වල නියැළේ. ඒවා නමින් පරිපාලනය ශක්තිමත් කිරීම, කාන්තාවන් බලගැන්වීම, ව්‍යාපාර අවස්ථා විස්තාරණය කිරීම, පාරිසරික ඔරොත්තු දීම වර්ධනය කිරීම හා කලාපීය සහයෝගය වර්ධනය කිරීම වේ.

ආසියා පදනමෙහි මව් සමාගම පිහිටා ඇත්තේ සැන් ෆ්‍රැන්සිස්කෝ නුවර වන අතර, ආසියාවේ හා වොෂින්ටන් DC හා පැතිර පවතින කාර්යාල 18 ක් සමග ආසියා පදනම වැඩකටයුතු සිදු කරයි. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමග සම්බන්ධතා පවත්වන ආසියා පදනමට, ද්වීපාර්ශවීය හා බහුපාර්ශවීය සංවර්ධන ආයතන පදනම් සහයෝගිතාවයන් හා තනි පුද්ගල ආදී වශයෙන් නොයෙකුත් ආයතන හරහා ආධාර ගලාගෙන එයි. 2016 වර්ෂයේ අප ඇමරිකන් ඩොලර් මිලියන 87.8 ක් සෘජුවම සංවර්ධන ව්‍යාපෘති සඳහා යෙදවූ අතර, පෙළපොත් සහ අනෙකුත් අධ්‍යාපනික ද්‍රව්‍යයන් වෙනුවෙන් ඇමරිකන් ඩොලර් මිලියන 9.5 ක් වැයකර ඇත

# උප ජාතික පාලන වැඩසටහන

ආර්ථික වර්ධනයේ හා ආර්ථික ගතික ශක්ති වර්ධනයේ නැගී එන ආර්ථික කේන්ද්‍රයන් වන ද්විතීය නගරවල් වල ආර්ථික ඔරොත්තුදීමේ හැකියාව වර්ධනය උදෙසා ක්‍රියාකාරී ආර්ථික කේන්ද්‍ර සංකල්පය ගොඩනැගීම සඳහා ආසියානු පදනමේ ශ්‍රී ලංකා උප ජාතික පාලන වැඩසටහන පළාත් පාලන ආයතන නවයක මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ඇත. මෙම වැඩසටහනේ සමස්ත පුළුල් අරමුණ වනුයේ අත්දුටු අනුරූප බලාත්මක ලෙස ආයතනගත කිරීමයි.

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මුළු බල ප්‍රදේශයම ආවරණය වන පරිදි පිහිටුවා ඇති මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා විසින් බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සැපයිය යුතු සේවාවන් සඳහා අවශ්‍ය වියදම් ආවරණය කර ගැනීමට හැකිවන පරිදි යථෝක්ත පළාත් පාලන ආයතන සංස්ථාපනය කර ඇති අන පනත් මඟින් ආදායම් ප්‍රභවයන් හඳුන්වා දී ඇත. ඊට අමතරව වෙනත් නීති ගණනාවක් මඟින්ද එකී නීති යටතේ පළාත් පාලන ආයතන වලට පැවරී ඇති බලතල ප්‍රකාරව ආදායම් උපයා ගැනීමට නෛතික ප්‍රතිපාදන සැලසී ඇත.

එහෙත් ශ්‍රී ලංකාවේ බොහොමයක් පළාත් පාලන ආයතන විසින් සභාවට ලැබිය යුතු ආදායම් නියමිත පරිදි අයකර නොගන්නා බවත් ඒ හේතුකොට ගෙන ඇතැම් පළාත් පාලන ආයතන වල සම්මුචිත හිඟ ආදායම් ප්‍රමාණය ඉතා විශාල අන්දමින් වැඩිවී ඇති බවත් මේ සම්බන්ධයෙන් ආසියානු පදනම මඟින් තෝරාගන්නා ලද පළාත් පාලන ආයතන වල පවත්වන ලද ආදායම් තක්සේරුකරන අනුකූලතා විගණනයේදී (Revenue Assessment Compliance Audit) අනාවරණය වී ඇත. නිරීක්ෂණය වී ඇති කරුණු අනුව මෙයට හේතුවී ඇත්තේ මූලික නීතිය හා වෙනත් නීති යටතේ පළාත් පාලන ආයතනයට අයකර ගත හැකි ආදායම් මූලාශ්‍රයන් හා එම ආදායම් අයකර ගැනීමේ නෛතික ක්‍රියාවලිය පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොතිබීමත් ආදායම් ඒකරාශීකරණය පිළිබඳව අදාල බලධාරීන් සතු වගකීම් හා කාර්යභාරයන් පිළිබඳ නිසි අවධානයක් නොතිබීම හා ප්‍රමාණාත්මක පරිදි වර්ධනය වී ඇති හිඟ ආදායම් අයකර ගැනීම සඳහා ක්‍රමවත් සැලැස්මක් නොතිබීමත් බැව් වැඩිදුරටත් අනාවරණය වී ඇත.

එබැවින් මූලික වශයෙන් ඒ ඒ පළාත් පාලන ආයතන සංස්ථාපිත අනපනත් යටතේ ආදායම් උත්පාදනය කර ගත හැකි ආදායම් ප්‍රභවයන් මොනවාද යන්න පිළිබද අවබෝධයක් ලබා දීමේ අපේක්ෂාවෙන් මෙම අත්පොත ආසියානු පදනම මඟින් ඕස්ට්‍රේලියානු රජයේ ආධාර යටතේ උප ජාතික පාලන වැඩසටහන (Subnational Governance Program - SNGP) මගින් ප්‍රකාශයට පත්කර ඇත.

**එච්. ජී.සි ජයතිස්ස**

උපදේශක (නීති හා පළාත් පාලන)

# පටුන


හැඳින්වීම iii

1 වන පරිච්ඡේදය

01 වරිපනම් හා බදු (Rate& Taxes) 1

01.1 වරිපනම් 1

01.2 විශේෂ වරිපනම් 2

2 වන පරිච්ඡේදය

02 වරිපනම් සම්බන්ධයෙන් වූ නෛතික ප්‍රතිපාදන 4

02.1 මහා නගර සභා ආඥා පනත (252 වන අධිකාරය) 4

02.2 නගර සභා ආඥා පනත (255 වන අධිකාරය) 5

02.3 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත 6

3 වන පරිච්ඡේදය

03 වරිපනම් බදු ප්‍රතිශතය ගණනය කිරීම 8

4 වන පරිච්ඡේදය

04 වරිපනම් බදු පැනවීම හා අයකිරීම 9

04.1 අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම 9

04.2 වාර්ෂික වරිපනම් බදු පැනවීම 9

04.3 වරිපනම් බද්දෙන් නිදහස් දේපල 10

04.4 වරිපනම් බද්දට අදාල තක්සේරු දැන්වීම්
( K පෝරම) නිකුත් කිරීම 11

04.5 වරිපනම් බදු අඩු කිරීම 12

04.6 වරිපනම් බදු සඳහා වට්ටම් ලබාදීම් 13

5 වන පරිච්ඡේදය

05 තක්සේරු විරෝධතා 14

05.1 තක්සේරු විරෝධතා පරීක්ෂණ ක්‍රියාවලිය 14

05.2 විරෝධතා විමර්ෂනයෙන් පසු අදාල නෛතික විධිවිධාන 15

6 වන පරිච්ඡේදය 16

06 වරිපනම් බදු තක්සේරු කිරීම, පැනවීම හා අය කර ගැනීමේ කාර්ය පියවරයන් 16

7 වන පරිච්ඡේදය 18

07 දේපල තහනම් කිරීම 18

07.1 දේපල තහනමට ගැනීම සම්බන්ධයෙන් වූ සීමාවන් 18

07.2 තහනමට ගත් දේපල විකිණීම 19

8 වන පරිච්ඡේදය 20

08 වරිපනම් බදු සාර්ථක ලෙස එකතු කර ගැනීමට නිර්දේශිත කාර්ය පියවරයන් 20

9 වන පරිච්ඡේදය 23

09 පළාත් පාලන ආයතනයට අයවිය යුතු වරිපනම් ආදායම් සම්බන්ධයෙන් නිලධාරීන් සතු කාර්යභාරය 23

09.1 වගකිව යුතු නිලධාරීන් 23

10 වන පරිච්ඡේදය 24

ඇමුණුම - 01 මහා නගර සභාව - වර්ෂය සඳහා වරිපනම් පැනවීම 24

ඇමුණුම - 02 නගර සභාව - වර්ෂය සඳහා වරිපනම් පැනවීම 26

ඇමුණුම - 03 ප්‍රාදේශීය සභාව - වර්ෂය සඳහා වරිපනම් පැනවීම 27

ඇමුණුම - 04 දේපල තක්සේරු විරෝධතා පරීක්ෂණ සටහන් පත්‍රය 28

ඇමුණුම - 05 තක්සේරු දැන්වීම් ආකෘතිය 29

ඇමුණුම - 06 ගෙවීම් පැහැර හරින්නන්ට විරුද්ධව නිකුත් කෙරෙන විනිග්‍රහන බලපත්‍ර ආකෘතිය 30

## 1. පළාත් පාලන ආයතනයක වගකීම් හා කාර්යභාරය

මහජනතාවගේ ඡන්දයෙන් තේරී පත්වන මහජන නියෝජිතයින්ගෙන් සැදුම් ලත් පළාත් පාලන ආයතනයක වගකීම් හා කාර්යභාරය වන්නේ ;

> **"නීතියෙන් නිශ්චිත කරන ලද කිසියම් පරිපාලන සීමා සහිත ප්‍රදේශයක ජීවත්වන සහ එම ප්‍රදේශයට සංක්‍රමණය වන ජනතාව සම්බන්ධයෙන් එකී බල ප්‍රදේශයේ පොදු මංමාවත්, මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා පාලනය පරිපාලනය කිරීම තුලින් එම කටයුතු ආරක්ෂා කර ගැනීම හා ප්‍රවර්ධනය කිරීමෙන් මහජනතාවගේ සුබ විහරණය, සුව පහසුව හා සුභසාධනය ඇති කර පවත්වාගෙන යාම පිණිස එම ආයතනය සතු සම්පත් ඵලදායී ආකාරයෙන් උපයෝගී කරගැනීම හා මෙහෙයවීම එකී බල ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයේ වගකීම හා කාර්යභාරය වන්නේ ය."**

මෙම කාර්යභාරය පිළිබඳව ඒ ඒ පළාත් පාලන ආයතන සංස්ථාපිත අණපනත් වල පහත දැක්වෙන වගන්ති වලින් පැහැදිලිව පෙන්වා දී ඇත.

| | |
|---|---|
| මහා නගර සභා ආඥා පනතේ | - 4 වගන්තිය |
| නගර සභා ආඥා පනතේ | - 4 වන වගන්තිය |
| ප්‍රාදේශීය සභා පනත | - 3 වන වගන්තිය |

යථෝක්ත වගකීම් හා තමන්ට පැවරී ඇති කාර්ය භාරය ඉටු කිරීමේදී එනම් තම බල ප්‍රදේශය තුල සමාජ හා භෞතික යටිතල පහසුකම් මෙන්ම අනිකුත් පොදු පහසුකම්ද වඩාත් ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා පළාත් පාලන ආයතන වලට මූල්‍ය ශක්තියක් තිබිය යුතුය. එම මූල්‍ය ශක්තිය තහවුරු කර ගැනීම සඳහා ඒ ඒ පළාත් පාලන සංස්ථාපිත නීතිය හා සෙසු නීති යටතේ ඉතා පහසුවෙන් ලබාගත හැකි ආදායම් විෂයයන් රැසක් හඳුන්වාදී ඇත.

## 2. පළාත් පාලන ආයතන වල ආදායම්

පළාත් පාලන ආයතනයකට ලබාගත හැකි ආදායම් හා ලැබීම් ප්‍රධාන කොටස් දෙකකට වෙන් කල හැකියි. එනම්:

I. පුනරාවර්ථන ආදායම්

II. ප්‍රාග්ධන ආදායම්

මේ අනුව මෙම කොටස් දෙක යටතේ ලබා ගත හැකි ආදායම් පහත පරිදි පෙන්වා දිය හැකිය.

පළාත් පාලන ආයතන වල ආදායම්




## 3. ආදායම් වර්ගීකරණය හා ඊට අදාල නෛතික ප්‍රතිපාදන

පළාත් පාලන ආයතන වලට උත්පාදනය කර ගත හැකි ආදායම් පවත්නා ප්‍රධාන ආදායම් වර්ගීකරණය අනුව පහත පරිදි වර්ග කළ හැකි අතර ඒ ඒ ආදායම් පැනවීම හා ආදායම් ඒකරාශීකරණය සඳහා අදාල නෛතික ප්‍රතිපාදන ද පහත දක්වා ඇත.

### 3.1 වරිපනම් හා බදු (Rate & Taxes)

මහා නගර සභා හා නගර සභා ප්‍රධාන ආදායම්

විෂය අංකය -310

ප්‍රාදේශීය සභා ප්‍රධාන ආදායම්

විෂය අංකය -10

මෙම ආදායම් ශීර්ෂය යටතට ගැනෙන වරිපනම් හා බදු වර්ග පහත දක්වා ඇත.

| බදු වර්ගය | පැනවීමට හා අය කරගැනීමට අදාල නෛතික ප්‍රතිපාදන (පනතේ අදාල වගන්තිය) | | | වෙනත් විස්තර |
|---|---|---|---|---|
| | MC | UC | PS | |
| 01. වරිපනම් | 230-244 දක්වා වන වගන්ති සහ 247 වගන්තිය ද අදාල වේ. | 160, 161, 166, 167, 168, 169, 170 යන වගන්ති සහ 172 වගන්තිය අදාල වේ. | 134 - 146 දක්වා වන වගන්ති ද 156- 158 දක්වා වන වගන්ති ද 160 - 166 දක්වා වන වගන්ති ද අදාල වේ.<br>ප්‍රා.ස මුල්‍ය හා පරිපාලන රීති 32-43 දක්වා | වාර්ෂිකව විධිමත් සභා සම්මුතියක් ගෙන බද්ද පැනවිය යුතුය. අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම අවශ්‍ය වේ. |
| 02. විශේෂ වරිපනම් | | 129 සහ 130 වගන්ති වල සඳහන් විධිවිධාන සහ ඉහත වරිපනම් යටතේ දක්වා ඇති අයකර ගැනීමේ වගන්ති මීටද අදාල වේ. | 108, 109 සහ ඉහත වරිපනම් යටතේ දක්වා ඇති අයකර ගැනීමේ වගන්ති මීටද අදාල වේ. | |
| 03 අක්කර බදු | - | - | 134(3), 146 වන වගන්ති ද 158 වන වගන්තිය ද 160 - 166 දක්වා වන වගන්තිද අදාල වේ. | වාර්ෂිකව විධිමත් සභා සම්මුතියක් ගෙන බද්ද පැනවිය යුතුය. |
| 04 කර්මාන්ත බදු | 247 | 165(අ) | 150<br>ප්‍රා.ස මුල්‍ය හා පරිපාලන රීති 59-66 දක්වා | වාර්ෂිකව විධිමත් සභා සම්මුතියක් ගෙන බද්ද පැනවිය යුතුය. |
| 05.ව්‍යාපාර බදු | 247(ඇ) | 165 ආආ | 152 ප්‍රා.ස මුල්‍ය හා පරිපාලන රීති 67 | වාර්ෂිකව විධිමත් සභා සම්මුතියක් ගෙන බද්ද පැනවිය යුතුය. |

| බදු වර්ගය | පැනවීමට හා අය කරගැනීමට අදාල නෛතික ප්‍රතිපාදන (පනතේ අදාල වගන්තිය) | | | වෙනත් විස්තර |
|---|---|---|---|---|
| | MC | UC | PS | |
| 06.වෘත්තීය බදු | 247(ඇ) | 165 ආඇා | 152 ප්‍රා.ස මූල්‍ය හා පරිපාලන රීති 67 | නියම කල හැකි උපරිම වෘත්තිය බද්ධ අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කර නොමැත. |
| 07. සංවර්ධනය නොකල ඉඩම් මත බදු | 247(ඇ) | 165(ඇ) | 153<br>ප්‍රා.ස මූල්‍ය හා පරිපාලන රීති 68 | වාර්ෂිකව විධිමත් සභා සම්මුතියක් ගෙන බද්ද පැනවිය යුතුය. |
| 08. වාහන හා සත්ව බදු | 245 සහ 246 වන වගන්ති | 162 සහ 163 වන වගන්ති | 147 සහ 148 වන වගන්ති ප්‍රා.ස මූල්‍ය හා පරිපාලන රීති 50-58 | වාර්ෂිකව විධිමත් සභා සම්මුතියක් ගෙන බද්ද පැනවිය යුතුය. |
| 09. විනෝද බද්ද | විනෝද බදු ආඥා පනතේ 2(1) හා 2(2) වගන්ති | විනෝද බදු ආඥා පනතේ 2(1) හා 2(2) වගන්ති | විනෝද බදු ආඥා පනතේ 2(1) හා 2(2) වගන්ති | අමාත්‍යවරයා විසින් වරක් පැනවීම ප්‍රමානවත් වේ. වාර්ෂික පැනවීමක් නොමැත.<br>අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතුය. |
| 10. ඇතැම් ඉඩම් විකිණීම මත බදු | 247 (ඉ) | 165 (ඇ) | 154 ප්‍රා.ස මූල්‍ය හා පරිපාලන රීති 69 | මෙම බද්ධ පැනවීම අවශ්‍ය නොවේ. |

ඉහත වාර්ෂිකව පැනවීමට අවශ්‍ය වන බදු විෂයයන් විධිමත් සභා සම්මුතියක් ගෙන පනවනු ලබන අතර නෛතිකව වලංගු වීම සඳහා අර්ථකථනය පිළිබඳ ආඥා පනතේ විධිවිධාන වලට අනුකූලව යථෝක්ත බදු පැනවීම පිළිබඳ නිවේදනය හා සභා යෝජනා ත්‍රෛභාෂිකව ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කළ යුතුය.

## බදු කුලි (Rent)

මහා නගර සභා හා නගර සභා ප්‍රධාන ආදායම්
විෂය අංකය -320
ප්‍රාදේශීය සභා ප්‍රධාන ආදායම් විෂය අංකය -20

මෙම ආදායම් ශීර්ෂය යටතට ගැනෙන ආදායම් වර්ග පහත දක්වා ඇත.

| ගාස්තු වර්ගය | පැනවීමට හා අය කරගැනීමට අදාල නෛතික ප්‍රතිපාදන (පනතේ අදාල වගන්තිය) | | | වෙනත් විස්තර |
|---|---|---|---|---|
| | MC | UC | PS | |
| 01.පදිංචි නිවාස | 188(1)(ඊ) | 129(එ) 130(1) | 108(ඌ) 109 | විධිමත් ගිවිසුමකට එළඹීම |
| 02. වෙළෙඳ සැල් හා කඩ | 40(1)(ඊ) 40(1)(ද) (iv) | 36(ඉ)(1) 36(ඉ)(ii) | 19 (1)(xii) ප්‍රා.ස මුල්‍ය හා පරිපාලන රීති 76 | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම හා විධිමත් ගිවිසුමකට එළඹීම |
| 03. බදුකර කුලී සතිපොල/ ඉඩම්/ ගොඩනැගිලි බදුදීම | 40(1)(ඊ) 40(1)(ද) (iv) | 36(ඉ)(1) 36(ඉ)(ii) | 19 (1)(xii) ප්‍රා.ස මුල්‍ය හා පරිපාලන රීති 76 | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම හා විධිමත් ගිවිසුමකට එළඹීම |
| 04.තාවකාලික කඩ කුලියට දීම | 40(1)(ඊ) 40(1)(ද) (iv) | 36(ඉ)(1) 36(ඉ)(ii) | 19(1)(xii) ප්‍රා.ස මුල්‍ය හා පරිපාලන රීති 76 | විධිමත් ගිවිසුමකට එළඹීම |
| 05. වාහන නවතා තැබිමේ ස්ථාන | 272 (32) | 157 (14අ) | 126 (vii)(ඌ) | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම හා විධිමත් ගිවිසුමකට එළඹීම |

## 3.3 බලපත්‍ර ගාස්තු (Trade Licence)

මහා නගර සභා හා නගර සභා ප්‍රධාන ආදායම්

විෂය අංකය -330

ප්‍රාදේශීය සභා ප්‍රධාන ආදායම් විෂය අංකය - 30

මෙම ආදායම් ශීර්ෂය යටතට ගැනෙන ආදායම් වර්ග පහත දක්වා ඇත.

| බදු වර්ගය | පැනවීමට හා අය කරගැනීමට අදාල නෛතික ප්‍රතිපාදන (පනතේ අදාල වගන්තිය) | | | වෙනත් විස්තර |
|---|---|---|---|---|
| | MC | UC | PS | |
| 01.වෙළෙඳ බලපත්‍ර ගාස්තු | 247(අ), 247(ආ ආ) සහ 308 වන වගන්ති | 162(1), 164(1), 164(2), සහ 219 වන වගන්ති | 147(1) 149 සහ 213 වන වගන්ති | ගාස්තු පැනවීම පිළිබඳව වාර්ෂිකව විධිමත් සභා සම්මුතියක් ගතයුතු අතර ඊට පූර්වයෙන් අතුරු ව්‍යවස්ථාද පනවා ගත යුතුය |
| 02. දැන්වීම් පුවරු ගාස්තු | 272(6) | 157(7) (ඊ) | 126(vii) (ඊ) | -එම- |
| 03. පරිසර බලපත්‍ර ගාස්තු | මධ්‍යම පරිසර අධිකාරී පනත යටතේ සෙසු පළාත් පාලන ආයතන වලට ද, වයඹ පළාතේ විශේෂයෙන් බලාත්මකව ඇති වයඹ පළාත් පරිසර ප්‍රඥප්තිය යටතේ වයඹ පළාතේ පළාත් පාලන ආයතන වලට ද පවරා ඇති බලය මත | | | අතුරු ව්‍යවස්ථා අවශ්‍ය වේ. |
| 04 .ප්‍රසිද්ධ රඟ දැක්වීම් ස්ථාන සඳහා නිකුත් කරන බලපත්‍ර ගාස්තු | ප්‍රසිද්ධ රඟ දැක්වීම් පිළිබඳ ආඥා පනත | | | අතුරු ව්‍යවස්ථා අවශ්‍ය වේ. |
| 05 .බිම් කට්ටි සැලැසුම් හා ගොඩනැගිලි ඉදි කිරීම් සඳහා නිකුත් කරන බලපත්‍ර | 1978 අංක 41 දරන න.ස. අධිකාරී පනත යටතේ සාදන ලද නියෝග මෙන්ම නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ විධිවිධාන | | | |
| 06. ගෝඝාතක බලපත්‍ර | ගෝඝාතක ආඥා පනත | | | අතුරු ව්‍යවස්ථා අවශ්‍ය වේ. |
| 07. සමාජ ශාලා බලපත්‍ර මත අයකරන ගාස්තුව | 1975 අංක 17 දරන සමාජ ශාලා ආඥා පනත | | | අතුරු ව්‍යවස්ථා අවශ්‍ය වේ. |
| 08. වෙන්දේසි කරුවන්ට හා බ්‍රෝකරු වරුන්ට නිකුත් කරන බලපත්‍ර මත අය කරන ගාස්තු | වෙන්දේසිකරුවන් හා බ්‍රෝකරුවරුන් පිළිබඳ ආඥා පනත | | | අතුරු ව්‍යවස්ථා අවශ්‍ය වේ. |

## 3.4 සේවා සඳහා ගාස්තු

මහා නගර සභා හා නගර සභා ප්‍රධාන ආදායම්

විෂය අංකය -34

ප්‍රාදේශීය සභා ප්‍රධාන ආදායම් විෂය අංකය - 40

පළාත් පාලන ආයතන වලින් සපයනු ලබන සේවාවන් පදනම් කර ගෙන මෙම ගාස්තු අය කිරීමට හැකියාව ඇත.

මෙම ආදායම් ශීර්ෂය යටතට ගැනෙන ආදායම් වර්ග පහත දක්වා ඇත.

| ගාස්තු | පැනවීමට හා අය කරගැනීමට අදාල නෛතික ප්‍රතිපාදන (පනතේ අදාල වගන්තිය) | | | වෙනත් විස්තර |
|---|---|---|---|---|
| | MC | UC | PS | |
| 01 උකස් ලියාපදිංචි කිරීම | 272(7) (ඇ) | 157(5)(ඈ) | 126(v)(ඈ) | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම අවශ්‍ය වේ |
| 02 .විපීරේඛා සහතික නිකුත් කිරීම | 60 272(2) (උ) | 157(8)(ඊ) | 126(viii) (ඌ) | |
| 03. ගිනි නිවීමේ සේවා | 272(18) 272(26) 272(28) (ඊ) | 157(11) (ඒ) | 126(xii)(ඒ) | |
| 04.සුසාන භූමි හා ආදාහනාගාර ගාස්තු | 267(1), 272(13) සහ සුසානභූමි ආඥා පනත | 153, 157(13) සහ සුසානභූමි ආඥා පනත | 126(xiv) සහ සුසානභූමි ආඥා පනත | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම අවශ්‍ය වේ |
| 05. තහනමට ගත් දේපල රඳවා ගැනීමේ ගාස්තු | 255(ආ) 255(ඇ) 255(ඈ) | 170 සහ මහා නගර සභා ආඥා පනතේ අදාල විධිවිධාන | 161(ආ) 161(ඇ) 161(ඈ) | |
| 06. ගලි සේවා ගාස්තු | 272(5) (ආ) | 157(9)(ආ) | 126(ix)(ආ) | |
| 07. පුස්තකාල සාමාජික ගාස්තු | 272(28) (ඊ) | 157(13) | 126(xiv) | |

## 3.5 වරෙන්තු ගාස්තු හා දඩ

මහා නගර සභා හා නගර සභා ප්‍රධාන ආදායම්

විෂය අංකය -350

ප්‍රාදේශීය සභා ප්‍රධාන ආදායම් විෂය අංකය - 50

දේපල තහනම් කිරීම සඳහා නිකුත් කරනු ලබන වරෙන්තු මත මෙම ගාස්තු අයකරනු ලැබේ

මෙම ආදායම් ශීර්ෂය යටතට ගැනෙන ආදායම් වර්ග පහත දක්වා ඇත.

| දඩ හා ගාස්තු | පැනවීමට හා අය කරගැනීමට අදාල නෛතික ප්‍රතිපාදන (පනතේ අදාල වගන්තිය) | | | වෙනත් විස්තර |
|---|---|---|---|---|
| | MC | UC | PS | |
| 01. වරෙන්තු ගාස්තු | 252,254, 255 | 170 සහ MCO විධිවිධාන | 159, 160 | වරෙන්තු නිකුත් කළ යුතුය |
| 02. උසාවි දඩ | 163 185(2) (ආ) | 158(2)(අ) සහ 4 වන උපලේඛන | 129(2) (අ) සහ පලමුවන උපලේඛන | උපලේඛන සකස් කිරීම කඩිනම් කළ යුතුය |
| 03 දඩ | 163, 185(2) (ආ) | 158 හා 4 වන උපලේඛනය | 129(2) (අ) සහ පලමුවන උපලේඛනය | -- |
| 04. ප්‍රමාද ගාස්තු | බදු/කුලී ගිවිසුම | බදු/කුලී ගිවිසුම | බදු/කුලී ගිවිසුම | -- |
| 05. වන්දි | සභා සතු දේපල හානිවීම් මත අය කරන ගාස්තු (පාරවල් පළුදු කිරීම) | | | අතුරු ව්‍යවස්ථා අවශ්‍ය වේ. |

## 3.6 වෙනත් ආදායම්

ඉහත ප්‍රධාන ආදායම් විෂය යටතට අයත් නොවූ වෙනත් ආදායම් මිට ඇතුලත් වේ.

මහා නගර සභා හා නගර සභා ප්‍රධාන ආදායම්

විෂය අංකය -360

ප්‍රාදේශීය සභා ප්‍රධාන ආදායම් විෂය අංකය - 60

මෙම ආදායම් ශීර්ෂය යටතට ගැනෙන ආදායම් වර්ග පහත දක්වා ඇත.

| ගාස්තු, පොළී හා විකුණුම් ආදායම් | බද්ද පැනවීමට හා අය කරගැනීමට අදාල නෛතික ප්‍රතිපාදන (පනතේ අදාල වගන්තිය) | | | වෙනත් විස්තර |
|---|---|---|---|---|
| | MC | UC | PS | |
| 01 මුද්දර ගාස්තු | 185(2) (ඇ) | 158(2)(ආ) | 129(2)(ආ) ප්‍රා.ස මූල්‍ය හා පරිපාලන රීති 81 | උපලේඛන සකස් කිරීම කඩිනම් කළ යුතුය |
| 02 සේවක ණය හා පොලී | ණය ගිවිසුම් | | | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම අවශ්‍ය වේ |
| 03 ආයෝජන පොලී | ස්ථිර තැන්පත්, ඉතිරි කිරීමේ තැන්පත් සඳහා ලැබෙන පොලී සහ භාණ්ඩාගාර බිල්පත් ආදිය සඳහා ලැබෙන පොලී | | | ආයෝජන සහතික ලබාගැනීම |
| 04 විකුණුම් | ප්‍රාග්ධන වත්කම් හැර සභාව සතු වෙනත් වත්කම් විකිණීමෙන් ලැබෙන ආදායම් (පෝරම ගාස්තු /අබිලි ද්‍රව්‍ය/කැළිකසළ අලෙවි කිරීම | | | විධිමත් සභා සම්මුතයක් ගත යුතුය |
| 05.ජලය විකිණීම් | සභාව විසින් සපයනු ලබන ජල සේවාව වෙනුවෙන් අය කරන ගාස්තු වලින් මෙම ආදායම් උත්පාදනය කරනු ලැබේ | | | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම අවශ්‍ය වේ |

## 3.7 රජයේ ආධාර හා මාරු කිරීම

මහා නගර සභා හා නගර සභා ප්‍රධාන ආදායම්

විෂය අංකය -370

ප්‍රාදේශීය සභා ප්‍රධාන ආදායම් විෂය අංකය - 70

මෙම ආදායම් ශීර්ෂය යටතට ගැනෙන ආදායම් වර්ග පහත දක්වා ඇත.

| ආදායම් වර්ගය | ආදායම් ලාබගැනීම සඳහා වූ විධිවිධාන | වෙනත් විස්තර |
|---|---|---|
| 01 . සේවක වැටුප් හා සහික දීමනා ප්‍රතිපූරණ | පළාත් පාලන ආයතන වලට මෙවැනි ආධාර සැපයීමට රජය කිසිසේත් බැඳී නොමැති බවද සැලකිය යුතුය. | පළාත් සභා ප්‍රඥප්ති |
| 02 සාමුහික ආධාර | නිශ්චිත කාර්යයක් නොදක්වා ප්‍රදානය කරනු ලබන රජයේ ආධාර | -- |
| 03 . විදේශ ආධාර | රාජ්‍ය නොවන සංවිධාන මඟින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රදානය කරනු ලබන ආධාර | -- |

## 4. පළාත් පාලන ආයතන සංස්ථාපිත ආඥා පනත් හා වෙනත් අණ පනත් යටතේ පනවා ගෙන ඇති අතුරු ව්‍යවස්ථා වලින් අය කර ගැනීමට බලය පැවරී ඇති ආදායම් වර්ග

| අතුරු ව්‍යවස්ථාව | ආදායම් වර්ගය | ම.න.ස (MCO) | න.ස (UCO) | ප්‍රා.ස. PS Act |
|---|---|---|---|---|
| 01. කසල ශෝධනය | මාසික කසල ශෝධන ගාස්තුව | 272 (3) (ආ) | 157(9) (ආ) | 126(සං)(ආ) |
| 02. ලැගුම් නිවාස | බලපත්‍ර ගාස්තුව | 272 (22) | 157(9) (ඉ) | 126(සං)(ඉ) |
| 03. වැසිකිළි ඉදි කිරීම සහ නඩත්තු කිරීම | බලපත්‍ර ගාස්තුව | 272 (3) (අ) හා 272 (5) (ආ) (ඇ) | 157 (8) (ඈ) 157 (9) (ඇ) | 126(ix)(ඇ) |
| 04. හෝටල් | බලපත්‍ර ගාස්තුව | 272 (19) | 157(9) (ඌ) | 126(ix)(ඌ) |
| 05. බත් කඩ ආපන ශාලා සහ තේ කෝපි කඩ | බලපත්‍ර ගාස්තු | 272 (22) | 157 (9) (ඌ) | 126(ix)(ඌ) |
| 06. බේකරි | බලපත්‍ර ගාස්තුව | 272 (8) (අ) | 157 (9) (ඌ) | 126(ix)(ඌ) |
| 07. කිරි පට්ටි හා කිරි වෙළඳාම් | බලපත්‍ර ගාස්තුව | 272(23) | 157(9) (ඒ) | 126(ix)(එ) |
| 08. මාලු විකිණීම | බලපත්‍ර ගාස්තුව | 272 (8) (ඇ) | 157 (9) (ක) | 126(ix) (ඒ) |
| 09. මස් විකිණීම | බලපත්‍ර ගාස්තුව | 145, 146 හා 272 (8) (ඇ),(ඈ) | 157 (9) (ක) | 126(ix) (ඒ) |
| 10.අප්‍රසන්න සහ අන්තරාදායක වෙළඳාම | බලපත්‍ර ගාස්තුව | 272 (15) | 157(9) (ග) | 126(ix)(ඔ) |
| 11. ලොන්ඩරි | බලපත්‍ර ගාස්තුව | 272 (21) | 157 (9) (ප) | 126(ix)(ඍ) |
| 12. සංචාරක වෙළෙන්දෝ | බලපත්‍ර ගාස්තුව | 272 (20)(ආ) | 157 (9) (ක) | 126(x)(අ) |
| 13. ගෝ ඝාතක මඩු | බලපත්‍ර ගාස්තුව | 272 (9) | 157 (10) (අ), 128 | 126(xi)(එ) |
| 14. පොදු වෙළඳ පොලවල් | අවසර පත්‍ර ගාස්තුව | 272 (28) (ඈ) | 157(11) | 126(xii) |

| අතුරු ව්‍යවස්ථාව | ආදායම් වර්ගය | ම.න.ස (MCO) | න.ස (UCO) | ප්‍රා.ස. PS Act |
|---|---|---|---|---|
| 15. ජල සම්පාදනය | ජල ගාස්තුව | 272 (28) (අ) | 157(12) (උ) | 126(xiii) |
| 16. පුස්තකාල | සාමාජික මුදල් හා දඩ මුදල් | 188 (1) (P) | 157(13) | 126(xiv) |
| 17. කොණ්ඩා සැකසීමේ සැලුන්හල් හා බාබර් සාප්පු | බලපත්‍ර ගාස්තුව | 272 (14) | 157 (9)(එ) | 126(xxiii) |
| 18. ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය | අවසර පත්‍ර ගාස්තුව | 272 (27) | 157(6)(උ) (7)(ඌ) | 126(xxx) |
| 19.ඉඩම් හා ගොඩනැගිලි අයිතිකරුවන් ගේ නම් හා ලිපිනයන් ලියාපදිංචි කිරීම හා පරික්ෂා කිරීම සඳහා වාර වාර්තා කැඳවීම | ලියාපදිංචි කිරීම හා පරික්ෂා කිරීමේ ගාස්තුව | 272 (7) (ආ) | 157(5)(ආ) සහ (ඇ) | 126(ඞ)(ආ) සහ (ඇ) |
| 20. නිශ්චල දේපළ පිළිබඳ උකස් හා එම උකස් හිමියන් ලියාපදිංචි කිරීම | ලියාපදිංචි කිරීම හා ලේඛන පරික්ෂා කිරීමේ ගාස්තුව | 272 (7) (ඇ) | 157 (5)(ඇ) | 126(ඞ)(ඇ) |
| 21. වාහන ගාල් කිරීම | වාහන ගාල් කිරීමේ ගාස්තු | 272 (32) | 157(14) (අ) | 126(vii)(ඌ) |

ඉහත දැක්වෙන නීති යටතේ පළාත් පාලන ආයතන වලට තම සේවාවන් ක්‍රියාත්මක කිරීම උදෙසා අවශ්‍ය වන ආදායම් උපයා ගැනීම සඳහා ප්‍රධාන ආදායම් ප්‍රභවයන් 43 ක් හා අතුරු ව්‍යවස්ථා යටතේ ආදායම් උත්පාදනය කර ගත හැකි ක්ෂේත්‍රයන් 21 ක් පිළිබඳ විස්තර දක්වා ඇත.

# 5. ස්වයං උත්පාදන ආදායම්

මූලික නීතිය හා වෙනත් නීති යටතේ පළාත් පාලන ආයතනයට අය කර ගැනීමට බලය ලැබී ඇති ආදායම් අතුරින් ප්‍රමුඛ අවධානයක් යොමුකළ යුත්තේ ස්වයං උත්පාදන ආදායම් සම්බන්ධයෙනි. ස්වයං උත්පාදන ආදායම් වශයෙන් අදහස් කරනුයේ පහත සඳහන් ආදායම් ප්‍රභවයන් වේ.

i. වරිපනම් හා බදු කුලී

ii. බලපත්‍ර ගාස්තු

iii. සේවා සඳහා ගාස්තු

iv. වරෙන්තු ගාස්තු හා දඩ

v. වෙනත් ආදායම්

## 5.1 ස්වයං උත්පාදන ආදායම් සම්බන්ධයෙන් ප්‍රමුඛ අවධානයක් යොමු කල යුත්තේ ඇයි ?

පළාත් පාලන ආයතන වලට පැවරී ඇති කාර්යභාරයන් ඉටුකිරීම සඳහා වූ ශක්තිය සපයන ප්‍රධානතම මාර්ගය වන්නේ එම ආයතන වලට ලැබෙන ආදායමයි. බල ප්‍රදේශයේ ප්‍රජාවගේ සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවාවන් ඉටු කිරීම සඳහා වැය වන මුදල් උපයා ගැනීම සඳහා ඒ ඒ පළාත් පාලන ආයතන සංස්ථාපිත අණපනත් වලින් ආදායම් උත්පාදනය කර ගැනීම සඳහා බලතල පවරා ඇත. එසේ බලතල පවරාදීම යටතේ පළාත් පාලන ආයතනය විසින් උපයාගනු ලබන ආදායම් උපයෝගී කර ගෙන ප්‍රජා සේවාවන් සැපයීමට හැකියාව ඇත. එබැවින් ලැබ් ඇති බලතල සීමා යටතේ අයකර ගත යුතු ස්වයං උත්පාදන ආදායම් කාර්‍යක්ෂමව අය කර ගැනිමට කටයුතු කළ යුතුව ඇත. ජනතාවගේ ජීවන රටාවන් වෙනස්වන අතර එයට සමගාමීව ඔවුන්ගේ අවශ්‍යතාවයන් ද නිතිපතා වැඩිවීම ස්වභාවිකය. මේ අනුව වර්තමාන ජනතා අපේක්ෂාවන් ඉටු කිරීම උදෙසා පළාත් පාලන ආයතන වලට දැඩි ආයාශයක් දැරීමට සිදුවේ. මේ සඳහා ආයතනයේ මූල්‍ය ශක්තිය වර්ධනය කර ගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුව ඇත. ඒ අනුව ඉහත සඳහන් කර ඇති ස්වයං උත්පාදන ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම හා එහි ප්‍රවර්ධනයක් ඇති කර ගැනීම අනිවාර්යයෙන්ම කළ යුතු කාර්යයක් බවට පත්වී ඇත.

# 6. භාව්‍ය ආදායම් (Potential Revenue) හා නව ආදායම් ප්‍රභවයන්

## 6.1 භාව්‍ය ආදායම්

- දැනටමත් සභාව අය කරනු ලබන ආදායම් ප්‍රභවයන් මගින් තවදුරටත් ලබාගත හැකි ආදායම් මේ ගනයෙහි ලා සැලකිය හැක. ඒ අනුව ඒ ඒ ආදායම් ප්‍රභවයන්ට අදාලව පහත දැක්වෙන ක්‍රියාමාර්ගයන් අනුග මනය කිරීම තුලින් භාව්‍ය ආදායම් වර්ධනය කර ගැනීමට හැකිවනු ඇත.

- බලප්‍රදේශය තුල සියලු පහසුකම් ඇතුලත්ව සංවර්ධනය වූ ප්‍රදේශ හඳුනාගෙන එම ප්‍රදේශයන් "දියුණු කල ප්‍රදේශයන්" වශයෙන් ප්‍රකාශයට පත්කර වරිපනම් බද්දට යටත් කිරීම

- මුදල් අය නොකර පවත්වාගෙන යනු ලබන සේවාවන් සඳහා දරනු ලබන පුනරාවර්ථන වියදම් ආවරණය කර ගත හැකි පරිදි වරිපනම් ප්‍රතිශතය වැඩි කිරීමට පියවර ගැනීම

- අවම වශයෙන් වසර 5 කට වරක් දේපල වල වාර්ෂික වටිනාකම ප්‍රතිශෝධනය කිරීම

- සභාව සතු දේපල කුලියට දීමෙන් අයකරනු ලබන මාසික කුලිය නැවත තක්සේරුවකට ලක් කිරීම

- එමෙන්ම කිසියම් ගාස්තුවක් අය කර සපයනු ලබන සේවාවන් සැපයීමේ අය කරනු ලබන ගාස්තුව එකී සේවාව සැපයීමට දරනු ලබන පිරිවැය සැලකිල්ලට ගෙන ගාස්තු තීරණය කිරීමට පියවර ගැනීම

- බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන සියලු වෙළෙඳාම් කර්මාන්ත හා ව්‍යාපාරික ස්ථාන හඳුනාගෙන බද්දට හෝ බලපත්‍ර ගාස්තුවට යටත් නොවූ ව්‍යාපාර වලින් ව්‍යාපාර බදු හෝ ගාස්තු අය කිරීම

## 6.2 නව ආදායම් ප්‍රභවයන්

පොදුවේ පළාත් පාලන ආයතන සාම්ප්‍රදායිකව අයකරනු ලබන ආදායම් වලට අමතරව නව ආදායම් ප්‍රභවයන් කෙරෙහි අවධානය යොමු කිරීම වඩා වැදගත් වේ. ඒ අනුව සාම්ප්‍රදායික නොවන ආදායම් මාර්ග ලෙස පහත දැක්වෙන ආදායම් ප්‍රභවයන් හඳුන්වා දිය හැක.

i. සංවර්ධනය නොකල ඉඩම් මත බදු

ii. හෂ්මාවශේෂ කුටීර ගාස්තු

iii. භූමදාන ස්ථාන ගාස්තු

iv. කසළ ගාස්තු ( ව්‍යාපාරික ස්ථාන සහ රාජය ආයතන)

v. ක්‍රීඩාංගන ගාස්තු

vi. රැස්වීම් ශාලා ගාස්තු

vii. උත්සව ශාලා ගාස්තු

viii. සන්තර්පණ (Refreshment) මධ්‍යස්ථාන ඇති කිරීම

ix. වාණිජ ව්‍යාපෘති ආරම්භ කිරීම

x. අතිරික්ත මුදල් ආයෝජනය කිරීම තුලින් පොලී ලබා ගැනීම

මීට අතිරේකව පළාත් පාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇති පරිදි ස්වයං උත්පාදන ආදායම් වර්ධනය කර ගැනීම සඳහා පහත සඳහන් විෂයයන් ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු කිරීම වඩාත් වැදගත් වේ.

i. ජලය බෙදා හැරීම බාර ගැනීම සඳහා හැකියාව ඇති පළාත් පාලන ආයතන ජල යෝජනා ඇති කර ගැනීම

ii. ප්‍රදේශයේ ඇති පුරාවිද්‍යා, සංස්කෘතික හා දර්ශනීය ස්ථාන වැඩි දියුණු කොට සංචාරක කර්මාන්තයට සම්බන්ධ කිරීම

iii. තානායම් සේවය යළි ආරම්භ කිරීම

iv. මහජන උද්‍යාන හා විවෘත ප්‍රදේශ ඇති කිරීම

v. කුඩා කර්මාන්ත ජනපද පිහිටුවීම

vi. ආයුර්වේද නිෂ්පාදන කටයුතු කිරීම

vii. ශිල්පී තත්ත්වයෙන් පෙර පාසල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඇති කිරීම

viii. ගිනි නිවීම් සේවා සැපයීම

ix. වෙළෙඳ පොලවල් හා ගම්බද පොලවල් සංවර්ධනය කිරීම

x. හැකියාව හා ශක්තියක් ඇති පළාත් පාලන ආයතන ප්‍රවාහන සේවා ඇරඹීම

xi. පෙර නිමි සිමෙන්ති භාණ්ඩ නිපදවීම හා බෙදා හැරීම

xii. වාහන සේවා සැපයුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීම

xiii. වාහන නඩත්තු ඒකක ආරම්භ කිරීම

xiv. පහසුකම් සහිතව ආයුර්වේද මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම

xv. සංචාරක නිවාඩු නිකේතන ස්ථාපිත කිරීම

xvi. සභාව සතු යන්ත්‍රෝපකරණ කුලී පදනම මත ලබාදීම

xvii. නගර ශාලා වර්තමානයට ගැලපෙන සේ නවීකරණය කර පුද්ගලික අංශය හා තරගකාරි ලෙසට කුලී පදනමට ලබාදීම

xviii. වෙරළ හා කලපුව ආශ්‍රිත පළාත් පාලන ආයතනයන් වෙරළ උද්‍යාන ඇති කර පවත්වාගැනීමට පියවර ගැනීමග

## 7. පළාත් පාලන ආයතනයට අයවිය යුතු ආදායම් සම්බන්ධයෙන් නිලධාරීන් සතු වගකීම හා කාර්යභාරය

සභාවට ලැබිය යුතු කිසියම් බද්දක්, බලපත්‍ර ගාස්තුවක්, කුලියක් හෝ සේවා සඳහා වන ගාස්.තුවක් හෝ වෙනත් ආදායමක් අයකර ගැණීම පිළිබඳ ව්‍යවස්ථාපිත විධි විධාන ඒ ඒ පළාත් ආයතන සංස්ථාපිත අනපනත් වල පැහැදිලිවම දක්වා ඇත.

### 7.1 වගකිව යුතු නිලධාරීන්

i. මහා නගර සභාවක නාගරික කොමසාරිස්

ii. නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක ලේකම්

iii. ආදායම් පරීක්ෂක හා ආදායම් පරිපාලක වරුන්

iv. ආදායම් විෂයභාර කළමනාකරණ සහකාරවරුන්

v. ගිණුම් නිලධාරි/ගණකාධිකාරි

**නාගරික කොමසාරිස් සතු ව්‍යවස්ථාපිත වගකීම**

**මහා නගර සභා ආඥා පනතේ 254 (අ) (1) වගන්තිය**

මේ ආඥා පනතේ විධි විධාන යටතේ හෝ මේ ආඥා පනත යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් රීතියක් හෝ නියෝගයක් යටතේ යම් බද්දක්, දඩ මුදලක්, දණ්ඩන මුදලක් දඬුවම් වශයෙන් වූ ගෙවීමක් ගාස්තුවක් හෝ වෙනත් ගෙවීමක් මහා නගර සභාවට අයවිය යුතුව තිබෙන අවස්ථාවක එහි යම් විධිවිධානයක හෝ එකී යම් අතුරු ව්‍යවස්ථාවක, රීතියක හෝ නියෝගයක පටහැනිව කුමක් සඳහන් වුවද ඒ බද්ද, දඩ මුදල, දඬුවමක් වශයෙන් වූ ගෙවීම, ගාස්තුව හෝ වෙනත් ගෙවීම් අයකර ගෙන එය මහා නගර සභාවේ අරමුදල් වලට බැර කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම නාගරික කොමසාරිස් වරයාගේ කාර්යය විය යුතුය.

(Where under provisions of this Ordinance, or any by law, rule or regulation made under this Ordinance, any duty, fine, penalty, fee or other payment has become due to the Municipal Council then, notwithstanding anything to the contrary in any such provisions or any such by law, rule or regulation, it shall be the duty of the Municipal Commissioner to take all steps necessary to recover such duty, fine, penalty, fee or other payment and credit it to the funds of the Municpal Council)

**නගර සභා ලේකම් සතු ව්‍යවස්ථාපිත වගකීම**

**නගර සභා ආඥා පනතේ 170 (අ) (1) වගන්තිය**

මේ ආඥා පනතේ විධිවිධාන යටතේ හෝ යම් ආඥා පනතක් යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක්, රීතියක් හෝ නියෝගයක් යටතේ යම් බද්දක්, දඩ මුදලක්, දණ්ඩන මුදලක් දඩුවම් වශයෙන් වූ ගෙවීමක් ගාස්තුවක් හෝ වෙනත් ගෙවීමක් නගර සභාවට අයවිය යුතුව තිබෙන අවස්ථාවක එහි යම් විධිවිධානයක එකී යම් අතුරු ව්‍යවස්ථාවක, රීතියක හෝ නියෝගයක පටහැනිව කුමක් සඳහන් වුවද ඒ බද්ද, දඩ මුදල, දඩුවමක් වශයෙන් වූ ගෙවීම, ගාස්තුව හෝ වෙනත් ගෙවීම අයකර ගෙන ඒ නගර සභාවේ අරමුදල් වලට බැර කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම සභාවේ ලේකම් ගේ කාර්ය විය යුතුය.

(Where under provisions of the Urban Council Ordinance, or any by law, rule or regulation made under the Urban Council Ordinance, any duty, fine, penalty, fee or other payment has become due to an Urban Council then, notwithstanding anything to the contrary in any such provisions or any such by law, rule or regulation, it shall be the duty of the Secretary to take all steps necessary to recover such duty, fine, penalty, fee or other payment and credit it to the funds of the Urban Council)

**ප්‍රාදේශීය සභා ලේකම් සතු ව්‍යවස්ථාපිත වගකීම**

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත**

ප්‍රාදේශීය සභා පනතින් ආදායම් අයකර ගැණීම පිළිබද වගකීම සහා ලේකම් වරයා වෙත පැවරෙන බවට නිශ්චිතවම සඳහන්කර නැති නමුදු, යථෝක්ත පනතේ වගන්ති කිහිපයකින් ඒ පිළිබද වගකීම සහා ලේකම් වරයා වෙත පවරා ඇත. උදාහරණයක් ලෙස ප්‍රාදේශීය සභා පනතේ 148(7), 150(4), 152(4), 154(2), 159(1) හා 159(2) යනාදී වගන්ති පෙන්වා දිය හැකිය.

පළාත් පාලන ආයතනයක නගරාධිපති/ සභාපතිවරයා ප්‍රධාන විධායකයා වන අතර ප්‍රධාන පරිපාලන බලධාරියා වන්නේ නාගරික කොමසාරිස් / ලේකම්වරයා ය. සෙසු සියලුම නිලධරයන් හා සේවකයන් ඔහු යටතේ විය යුතු අතර ඔහුගේ විධානය අනුව ක්‍රියාකළ යුතු,ය

සභාවේ ප්‍රධාන පරිපාලන නිලධාරියා වශයෙන් නාගරික කොමසාරිස්වරයා/ ලේකම් වරයා විසින් සභාවේ සියලුම නිලධාරීන් හා සේවකයන් වෙත ඔවුනොවුන් විසින් ඉටුකළ යුතු කාර්යභාරය සම්බන්ධයෙන් රාජකාරි ලැයිස්තුවක් හා රැකියා විස්තරයක් මගින් රාජකාරි පැවරීමට පියවර ගත යුතුය.

## 7.2 ගණකාධිකාරි / ගිණුම් නිලධාරි සතු කාර්යභාරය හා රාජකාරි වගකීම්

නාගරික කොමසාරිස් හෝ ලේකම් වරයා විසින් රාජකාරි පැවරීමෙන් හා රැකියා විස්තරයක් මගින් කාර්ය පැවරීමත්, එකී පවරන ලද වගකීම ඒ ඒ නිලධාරියා විසින් තම අත්සන සහිතව භාරගැනීමත් සමගම යථෝක්ත වගකීම ඒ ඒ නිලධාරීන් වෙත පැවරෙනු ඇත.

i. සභාවේ වාර්ෂික මූල්‍ය සැලැස්ම පිළියෙල කිරීමට අවශ්‍ය දත්ත රැස්කර ගැනීම

ii. සභාවේ සියලුම ආදායම් හා වියදම් නිවැරදිව ගිණුම් ගත කෙරෙන බවට වගබලා ගැනීම

iii. ඇස්තමේන්තුගත ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ වාර්තා තබා ගැනීම

iv. සෑම මාසික සභා රැස්වීමකටම පසුගිය මාසයේ ඒ පිළිබඳ තොරතුරු වාර්තාවක් ඉදිරිපත් කරනු ලබන බවට වගබලා ගැනීම

v. හිඟ ආදායම් අය කර ගැනීමට හා වරිපනම් බදු ගෙවීම පැහැර හරින්නන්ගේ දේපල තහනමට ගැනීමට අවශ්‍ය විධිවිධාන සැලසීම

vi. බලපත්‍ර ගාස්තු ගෙවීම් පැහැර හරින්නන් පිළිබඳව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම

## 7.3 ආදායම් පරීක්ෂක / ආදායම් පරිපාලකවරුන් සතු කාර්යභාරය හා රාජකාරි වගකීම්

i. බලප්‍රදේශයේ ඇති දේපල සමීක්ෂණය කිරීම

ii. දේපල භාවිතයේ වෙනස්කම් හඳුනාගැනීම

iii. තක්සේරු දැන්වීම් බෙදා හැරීම

iv. වරිපනම් බදු එකතු කිරීම

v. අනෙකුත් ආදායම් පිළිබඳ නිවේදන බෙදීම

vi. අනෙකුත් ආදායම් එකතු කිරීම

vii. වරිපනම් බදු පැහැර හරින්නන් හඳුනාගැනීම

viii. පවරන ලද බලය පිට වරිපනම් බදු ගෙවීම් පැහැර හරින්නන්ගේ දේපල තහනම් කිරීම

ix. කුලී හිඟ හිටුවා ඇති අය හඳුනාගැනීම

x. ගිවිසුම් ප්‍රකාරව ක්‍රියාමාර්ග ගැනීමට යොමුකරවීම

xi. අනෙකුත් ආදායම් හිඟ හිටුවා ඇති අය හඳුනාගැනීම

xii. විධිමත් පරිදි අධිකරණය වෙත වාර්තා කිරීම.

xiii. රථ වාහන පාලක පාලිකාවන් ගේ සේවය අධීක්ෂණය කිරීම

xiv. පෞද්ගලික බස් නැවතුම් පලවල් පරීක්ෂා කිරීම සහ හිඟ ගාස්තු අයකර ගැනීම

xv. ගොඩනැගලි අයදුම්පත්‍ර පිළිබඳ මූලික පරීක්ෂණ කටයුතු හා තක්සේරු දෙපාර්තමේන්තුවේ ආවරන අනුමැතියට යටත්ව (කලින් එලබෙන්නාවූ එකගතාවය මත) තක්සේරු කටයුතු

xvi. වරිපනම් ලේඛන හා වෙනත් ආදායම් ලේඛණ නම් වෙනස් කිරීම් සම්බන්ධව පරීක්ෂා කිරීම හා නිර්දේශ ලබාදීම

xvii. බදු සහන සැලසීම සම්බන්ධව පරීක්ෂා කිරීම වාර්තා කිරීම හා නිර්දේශ කිරීම

xviii. එලදාව බදු දීම හා වෙන්දේසි සම්බන්ධ නිර්දේශ කිරීම

xix. විනෝද බදු සම්බන්ධව පරීක්ෂා කිරීම හා දෛනික වාර්තා ඉදිරිපත් කිරීම

xx. සත්ව හා වාහන බදු අය කිරීම හා වැටලීම් කටයුතු.

xxi. අදාල බදු හා ගාස්තු ගෙවීම් පැහැර හරින්නන් පිළිබඳව නෛතික ක්‍රියා මාර්ග ගැනීම

xxii. ආයතනයට ලැබිය යුතු බලපත්‍ර ගාස්තු ව්‍යාපාර බදු පිළිබඳව පරීක්ෂා කර වාර්තා සැපයීම හා අයකර ගැනීම හා අධිකරණයට වාර්තා කිරීම.

xxiii. ප්‍රචාරක දැන්වීම් පුවරු හා තාවකාලික බැනර් ආදිය පරීක්ෂා කර වාර්තා කිරීම හා අදාල ගාස්තු අයකර ගැනීමට කටයුතු කිරීම

xxiv. තක්සේරු නොවූ ගොඩනැගිලි පිළිබඳව වාර්තා කිරීම

xxv. තක්සේරු ප්‍රතිශෝධන වලදී තක්සේරු නිලධාරීන්ගේ රාජකාරි කටයුතු වලට සහායවීම

xxvi. වාර්ෂිකව බලපත්‍ර ලබාගත යුතු හා ව්‍යාපාර බදු ගෙවිය යුතු ස්ථාන සම්බන්ධයෙන් වාර්ෂිකව සමීක්ෂණය කර වාර්තා කිරීම

xxvii. නව ආදායම් මාර්ග හඳුනා ගැනීම

xxviii. ක්ෂේත්‍රයේදී එකතු කරන බදු හා ගාස්තු එකතු කල දිනම හෝ ඊට පසු එළඹෙන රාජකාරි දිනයේදී අප්‍රමාදව පියවීමට කටයුතු කිරීම

xxix. රාජකාරියේ යෙදී සිටින සෑම අවස්ථාවකම සම්පූර්ණ නිල ඇඳුමෙන් සැරසී සිටීමග

xxx. තමන්ට පැවරුනු බලය මත අධිකරණයට වාර්තා කිරීමත් අධිකරණය ඉදිරියේදී පෙනී සිටිමින් පැමිනිල්ල මෙහෙයවීමේ කටයුතු සිදුකිරීම. (නීතීඥ වරයෙකු නොමැතිව)

**සභාවේ ආදායම් පරිපාලකවරුන්ට අමතරව ප්‍රධාන ආදායම් පරික්ෂකවරයෙක් සිටි නම් ඔහු විසින් අංශයට අදාල අනෙකුත් නිලධාරීන්ගේ රාජකාරි අධික්ෂණය කිරීම සිදු කළ යුතුව ඇත.**

## 8. නිලධාරීන් වෙත පවරා ඇති රාජකාරි, වගකීම් හා කාර්යභාරය නියමිත පරිදි ඉටු නොකිරීමේ ප්‍රතිවිපාක

පළාත් පාලන ආයතන වල සියලුම නිලධාරීන්ගේ සාමාන්‍ය හැසිරීම හා විනය පිළිබඳව අදාල වන්නේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ආයතන සංග්‍රහය වේ. විශේෂයෙන් ආයතන සංග්‍රහයේ 2 වන කාණ්ඩයේ (ඇතැම් පළාත් සභාවන් හි සම්මත කරගෙන ඇති විනය කාර්යය සංග්‍රහයන් ඇති විටදී ඒවාහි විධිවිධාන) XLVII පරිච්ඡේදයේ විධිවිධානයන් කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි. ඒ අනුව;

- පවරනු ලබන ඕනෑම රාජකාරියක් ඉටු කිරීමටත්,
- අදාල රාජකාරිමය උපදෙස් තේරුම්ගෙන පිළිපැදීමටත්,
- සිය තනතුරේ සහ සේවයේ හොඳ නම රැකීමටත්,
- අවංකව හා කාර්යක්ෂමව පවරා ඇති රාජකාරි අප්‍රමාදව ඉටුකිරීමටත්, තමන් බැඳී සිටිනු ඇත.

විශේෂයෙන් ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 8:1, 8:2, හා 8:3 අනුව,

➢ අදාල සියලුම නිතිරීති රෙගුලාසි චක්‍රලේඛ, නියෝග හා උපදෙස්, වලට අනුකූලව කටයුතු කළ යුතුය.

- ➢ එසේ කටයුතු නොකරන හෝ ඊට පටහැනි කටයුතු කරන නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගනු ලබනු ඇත
- ➢ එමෙන්ම බාහිර බලපෑම් මත පවරා ඇති රාජකාරි කටයුතු ඉටු කිරීමට නොහැකි වීම කිසිදු නිලධාරියෙකුට නිදහසට කරුණක් නොවන බව අවධාරණය කළ යුතුය.

මීට අමතරව, පවරා ඇති රාජකාරි වගකීම් නියමිත පරිදි ඉටු නොකිරීම මත සභාවට ලැබිය යුතු කිසියම් ආදායමක් හෝ ගාස්තුවක් නොලැබී ගියහොත් හෝ ලැබිය යුතු ආදායම් ප්‍රමාණාත්මක පරිදි හිඟ හිටුවා ඇති අවස්ථාවකදී එකී අලාභයේ හෝ හිඟ හිටුවා ඇති වටිනාකම අධිභාරයක් සේ සලකා තම පෞද්ගලික මුදලින් ගෙවීමට සිදුවන අතර පළාත් පාලන ආයතනයෙන් ස්ථාන මාරුවීම මත හෝ විශ්‍රාම යාම මත හෝ යථෝක්ත වගකීමෙන් තමන්ට නිදහස් වීමට නොලැබෙන අතර තමන්ගේ මියයාම දක්වා එම අධිභාර මුදල් ගෙවීමට යටත් වන බව අමතක නොකළ යුතුය.

තවද, සභාව සතු යම් මුදලක් හෝ දේපලක් හෝ වංක ලෙස පරිහරණය කරන්නාවූ හෝ එසේ පරිහරණය කිරීමට සහාය හෝ අනුබල දී ඇති විටෙක 1982 අංක 12 දරණ පොදු දේපල විෂයෙහිලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනත යටතේ අවුරුදු එකකට නොඅඩු එහෙත් අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හා දඩයකට යටත් වේ.

## 9. පළාත් පාලන ආයතන වල ආදායම් කළමනාකරණය කාර්යක්ෂමව පවත්වාගෙන යාම

පළාත් පාලන ආයතනවලට ලැබිය යුතු බදු හා ගාස්තු මුදල් අපේක්ෂිත ප්‍රමාණයන් අයකර ගැනීමටත් ප්‍රමාණාත්මක පරිදි හිඟ මුදල් ඒකරාශීකරණය සඳහා පහත දැක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

i. නීතිය අනුව සභාවට ලැබිය යුතු ආදායම් මූලාශ්‍රයන් මොනවාද යන්න ගැන හා ඊට අදාල නෛතික විධිවිධානයන් පිළිබඳ දැනුම හා අවබෝධය වර්ධනය කර ගැනීම

ii. විශේෂයෙන් ආදායම් ඒකරාශීකරණය සම්බන්ධයෙන් අදාල නිලධාරීන්ට (ආදායම් පරීක්ෂක හා ආදායම් පරිපාලක) නිශ්චිත රාජකාරි ලැයිස්තුවක් හා ඍකියා විස්තරයක් මඟින් රාජකාරි පැවරීම

iii. ආදායම් ඒකරාශීකරණය සම්බන්ධයෙන් තමන් සතු වගකීම් හා කාර්යභාරය පිළිබඳව නිලධාරීන් පැහැදිලි අවබෝධයකින් හා කැපවීමකින් යුතුව කටයුතු කිරීම

iv. බදු ගෙවිය යුතු ජනතාව වෙත බදු ගෙවිය යුතු බවට අදාල දැන්වීම් හෝ නිවේදන නියමිත පරිදි නිකුත් කිරීම

v. සභාවට ලැබිය යුතු මුදල් අයථා ලෙස පරිහරණය නොකිරීම හා අක්‍රමිකතා සිදු නොවීමට වගබලා ගැනීම

vi. ආදායම් ඒකරාශීකරණය කඩිනම් කිරීම හා කාර්‍යක්ෂමව ඉටු කිරීම සඳහා ජංගම සේවා, ප්‍රචාරක දැන්වීම් බාහිර ආයතන සම්බන්ධීකරණය මගින් හා නිවසින් නිවසට ගොස් ක්ෂේත්‍රයේ බදු එකතු කිරීමේ විකල්ප ක්‍රමවේදයන් භාවිතා කිරීම.

vii. මාසික ආදායම් එකතු කිරීමේ ඉලක්ක තීරණය කිරීම හා එකී ඉලක්කයන් ලඟාකර ගැනිම සඳහා අදාල නිලධාරීන්ට වගකීම් පැවරීම

viii. අයවැයගත ආදායම් (Budgeted Income) හා සත්‍ය ආදායම් (Actual Income) එකතු කිරීම පිළිබඳව මාසිකව ප්‍රගති සමාලෝචනයක් සිදු කිරීම

ix. ආදායම් ඒකරාශීකරණයේ නියුතු නිලධාරීන්ගේ කටයුතු සම්බන්ධයෙන් නිරන්තර පසුවිපරමක් සිදු කිරීම

x. ආදායම් ඒකරාශීකරණයට අදාලව අතුරු ව්‍යවස්ථා පනවා ගැනිම

xi. ආදායම් ලේඛන නියමිත පරිදි තුලනය කර යාවත්කාලීනව පවත්වාගෙන යාම

xii. සභාවට ලැබිය යුතු ආදායම් එකතු කර ගැනීමේ අවශ්‍යතාවය හා එහි වැදගත්කම පිළිබඳව මහජන නියෝජිතයින් අවබෝධයෙන් කටයුතු කිරීම

xiii. ආදායම් ඒකරාශීකරණය හා ඒ ආශ්‍රිත අභ්‍යන්තර පාලනය ශක්තිමත්ව පවත්වාගෙන යාම

xiv. නීතියෙන් නියම කර ඇති නියමිත කාලවකවානුවන් තුලදී අදාල බදු හා ගාස්තු අයනොවිම සම්බන්ධයෙන් අධිකරණයට කරුණු වාර්තා කරමින් අවශ්‍ය නීතිමය ආවරණය ලබා ගැනීම.

එබැවින් පළාත් පාලන ආයතන වල මහජන නියෝජිතයින් හා ප්‍රධාන පරිපාලන නිලධාරීන් ඇතුථ කාර්ය මණ්ඩලය තමන්ට පැවරී ඇති වගකීම් හා කාර්යභාරය අවබෝධයෙන් යුතුව ඉටු කිරීම තුලින් පළාත් පාලන ආයතන වලට ලැබිය යුතු ආදායම් එකතුකර ගැනීමේ කාර්යක්ෂමතාවය වර්ධනය කරගත හැකි අතර එම ආදායම් ගෙන ප්‍රජා සේවාවන් ඉටු කිරීමටද හැකියාව ලැබෙනු ඇත.

Australian AID

The Asia Foundation

9 789550 168248